
- ## දේශීය මුද්‍රා නාට්‍ය කලාව හැඳින්වීම (ඉඟිනළු, නෘත්‍ය නාටක) හැඳින්වීම

තාත්ත්වික නාට්‍ය, ශෛලිගත නාට්‍ය, ගීත නාට්‍ය යනාදී නාට්‍ය අතර මුද්‍රා නාට්‍යය සුවිශේෂ කලා මාධ්‍යයකි. හස්ත මාර්ගයෙන් ඉදිරිපත් කරන සම්මත සංකේත මුද්‍රා නමින් හැඳින්වෙයි. මුද්‍රා මඟින් අදහස් ප්‍රකාශ කිරීම යන අරුතෙන් මුද්‍රා නාට්‍ය යන නාමය ව්‍යවහාර වන්නට ඇත.

චලන මාධ්‍ය කොට ගෙන භාවමය සංගීතයක් ප්‍රබල ව යොදා ගනිමින් රංගවස්ත්‍රාභරණ, වේෂ නිරූපණ, විදුලි ආලෝකය, වේදිකා සැරසිලි යනාදියේ සහය ඇති ව යම්කිසි සිද්ධියක් හෝ කථා ප්‍රවෘත්තියක් හෝ වාචික අභිනයෙන් තොර ව ඉදිරිපත් කිරීම මුද්‍රා නාට්‍ය ලෙසින් අර්ථ දක්වෙයි. මෙවැනි කලා කෘති අපරදිග රටවල බැලේ නමින් හැඳින්වේ.

මුද්‍රා භාවිතයට වඩා ඉඟි හා චලන යොදා ගැනීමත්, පසුබිම් ගීත භාවිත කිරීමත් නිසා දේශීය මුද්‍රා නාට්‍ය ඉඟිනළු යනුවෙන් 50 දශකයේ දී හැඳින්වුව ද, එයට විරුද්ධ මත එකල ද ගොඩ නැඟිණ. ඉඟිනළු ද, නෘත්‍ය නාටක ද නැතහොත් වෙනත් නමකින් හැඳින්විය යුතු නාට්‍යය වර්ගයක් ද යන්න පිළිබඳ ව විවිධ මතභේද වර්තමානයේ ද ගොඩ නැඟෙමින් පවතී.

- ## දේශීය මුද්‍රා නාට්‍ය කලාවේ ප්‍රභවය හා විකාශය


රබින්ද්‍රනාත් තාගෝර් තුමා

භාරතයේ විශ්ව භාරතී විශ්වවිද්‍යාලයේ (ශාන්ති නිකේතනයේ) නිර්මාතෘ මහා කවි රබින්ද්‍රනාත් තාගෝර්තුමා, 1934 දී හොරණ ශ්‍රී පාලි ආයතනයට මුල්ගල තැබීම සඳහා පැමිණියේ 34 දෙනෙකුගෙන් යුත් ශිල්පීන් කණ්ඩායමක් ද සමග ය. ඔහුගේ "ශාප්මෝචන්" නැමැති මුද්‍රා නාට්‍යය කොළඹ රීගල් නෘත්‍ය ශාලාවේ දී වේදිකා ගත කිරීම, දේශීය මුද්‍රා නාට්‍ය කලාවේ ආරම්භයට හේතු පාදක වූවා සේ ම, ශ්‍රී ලාංකේය කලා ඉතිහාසයේ නව පිටුවක් පෙරළීමට ද එය සමත් විය.

රබින්ද්‍රනාත් තාගෝර්තුමාගේ ශිෂ්‍යයකු වූ හොරණ ශ්‍රී පාලියේ ශාන්ති දේව් ඝෝෂ් නම් ආචාර්ය මණ්ඩලය සහ ශිෂ්‍යයන් සමග 1936 දී "සීතාහරණ" නෘත්‍ය නාටකය (මුද්‍රා නාට්‍ය) නිෂ්පාදනය කළේ ය. එය ලංකාවේ නිෂ්පාදනය වූ ප්‍රථම මුද්‍රා නාට්‍යය යි. ඉන්දීය නර්තන හා සංගීතය භාවිත කළ ඔහු විසින් 1936 දී උර්වශීජායම්, 1937 දී මනෝහර බන්ධනම්, 1938 දී ඡද්දන්තදායම් යනුවෙන් නිර්මාණ කිහිපයක් ඉදිරිපත් කරන ලදී. එවකට ශ්‍රී පාලියෙහි ශිෂ්‍යයකු වූ ප්‍රසිද්ධ මුද්‍රා නාට්‍ය ශිල්පී නිමල් වෙල්ගම මහතා මෙම මුද්‍රා නාට්‍යවල රඟ පෑ ප්‍රධාන නළුවෙකි.

(10 ශ්‍රේණිය නර්තනය අතිරේක කියවීම් පොත ඇසුරිණි.)

තාගෝර්තුමාගේ හා ශාන්තිදේව් ඝෝෂ්ගේ නිර්මාණ නැරඹීමෙන් මුද්‍රා නාට්‍ය රස විඳිය හැකි ප්‍රේක්ෂක පිරිසක් බිහි වූහ. එහි ප්‍රතිඵලයක් ලෙස නර්තන හා සංගීත කලාවන් කෙරෙහි උනන්දුවක් දක් වූ ශ්‍රී ලාංකේය ශිල්පීන් ඉන්දියාවට ගොස් ඉන්දීය නර්තන හා සංගීත කලාවන් හදාරා ලංකාවට පැමිණ මුද්‍රා නාට්‍ය නිර්මාණය කිරීම, දේශීය මුද්‍රා නාට්‍ය කලාවේ ප්‍රවර්ධනයට මහත් රුකුලක් විය.

1940 දශකයේ මුද්‍රා නාට්‍ය කලාවේ ආරම්භක ශිල්පීන් වශයෙන්, සීබට් ඩයස්, චිත්‍රසේන, ප්‍රේමකුමාර එපිටවෙල, පණිභාරත, නිමල් වෙල්ගම, වසන්ත කුමාර, ශේෂා පලිහක්කාර, ගංගානාථ ධර්මසේන යනාදි කලාකරුවන් නම් කළ හැකි ය.

මුල් වකවානුවේ මෙරට නිෂ්පාදනය වූ මුද්‍රා නාට්‍යයන්හි කථා වස්තුව, නර්තන විලාස, සංගීතය, රංග වස්ත්‍රාභරණ, වේශ නිරූපණය ආදිය දැඩි ලෙස භාරතීය ආභාසය සහිත ව ගොඩ නැඟිණ. එයට හේතු වූයේ නිර්මාණ ශිල්පීන් කථකලි, භරත නාට්‍යම් යනාදි භාරතීය නර්තන සම්ප්‍රදායයන් හැදෑරීමත්, භාරතීය නෘත්‍ය නාටක ඇසුරු කිරීමෙන් ලත් අත්දැකීම් තම නිර්මාණ සඳහා සෘජු ව ම යොදා ගැනීමත් වැනි හේතු සාධක ය. මෙකී ලක්ෂණ ගුරු කොට ගෙන දේශීය මුද්‍රා නාට්‍ය ගොඩනැගුණ ද භාරතීය නර්තන හා මුද්‍රා පිළිබඳ අවබෝධය නොමැති ශ්‍රී ලාංකේය ප්‍රේක්ෂකයන්ට මේවා රසවිඳීමට නො හැකි විය. එම නිසා මුද්‍රා නාට්‍ය නැරඹීමට ස්ථිර ප්‍රේක්ෂක පිරිසක් බිහි නො වූහ.

පසු කාලීන ව දේශීය නර්තන සම්ප්‍රදායයන් හා ගැමි නාටකවල ලක්ෂණ බැලේ නාට්‍ය නිර්මාණ සඳහා යොදා ගනිමින් ශ්‍රී ලාංකේය ප්‍රේක්ෂකයන්ට ගෝචර වන අයුරින් නිර්මාණ ඉදිරිපත් කිරීමට දේශීය නිර්මාණකරුවෝ උත්සුක වූහ.

ප්‍රසිද්ධ වේදිකා නළුවකු වූ සීබට් ඩයස් මහතා ඉන්දියානු නෘත්‍ය නාටක ශෛලියෙන් බැහැර ව දේශීය අනන්‍යතාවකින් යුතු ව පසුබිම් සංගීතය සඳහා දවුල්, තම්මැට්ටම් ආදිය යොදා ගනිමින් 1936 දී ''සිරිසඟබෝ'' නමින් නාට්‍යයක් නිෂ්පාදනය කළ අතර, එහි ප්‍රධාන චරිතය රඟපෑවේ ඔහුගේ පුත් චිත්‍රසේන ය.

1940 දශකයේ මුද්‍රා නාට්‍ය ශිල්පීන් කිහිපදෙනෙකු එක් වී ''පැජන්ට් ඔෆ් ලංකා'' නමින් සංවිධානයක් පිහිටුවා ඉදිරිපත් කළ මුද්‍රා නාට්‍ය මාලාව ද දේශීය මුද්‍රා නාට්‍ය ඉතිහාසයේ වැදගත් සන්ධිස්ථානයකි.

මෙකල චිත්‍රසේන මහතා ඇතුළු පිරිසක් විසින් කොල්ලුපිටියේ චිත්‍රසේන කණ්ඩායම නමින් සංවිධානයක් පිහිටුවා ගෙන විවිධ නිර්මාණ ඉදිරිපත් කරන ලද අතර, එහි රංගභූමි අලංකරණ හා වෙස් මෝස්තර ශිල්පියා වූයේ සෝමබන්ධු විද්‍යාපති මහතා ය. 1948 දී චිත්‍රසේනයන්ගේ රාවණා නාට්‍යය සඳහා ප්‍රථමයෙන් ඔහු විසින් රංගභූමි අලංකරණය හා වෙස් මෝස්තර සකස් කරන ලදි. එතෙක් නාට්‍ය හා නර්තන සඳහා භාවිත වූ රංග වස්ත්‍රාභරණ හා පසුබිම් අලංකරණ වෙනුවට කෙටි කාලයකින්, පහසුවෙන් භාවිත කළ හැකි, චරිතවලට හා විදුලි ආලෝකයට ගැළපෙන, ඉහළ නිමාවකින් යුත්, නිර්මාණශීලී රංග වස්ත්‍රාභරණ හා පසුබිම් අලංකරණ ඔහු විසින් නිර්මාණය කරන ලදි. මෙම කටයුතු නිසා රංග වස්ත්‍රාභරණ, වෙස් මෝස්තර නිර්මාණය හා රංගභූමි අලංකරණයෙහි විශාල පරිවර්තනයක් ඇති කිරීමට ද ඔහු සමත් විය.

(10 ශ්‍රේණිය නර්තනය අතිරේක කියවීම් පොත ඇසුරිනි.)

1950 දී වේදිකා ගත වූ ප්‍රේමකුමාරයන්ගේ "සැලලිහිණිය" සිංහල හැඩයක් ගත් මුද්‍රා නාට්‍යයකි. සිංහල සාහිත්‍ය කෘතියක් ඇසුරු කිරීම මෙන් ම නර්තන, රංග වස්ත්‍රාභරණ හා වේදිකා දර්ශන ද නවතාවක් ගෙන දුන් සාධක විය. 1955 දී ඉඟිතළු යන වචනය ප්‍රථම වරට යොදා ගන්නා ලද්දේ ද ප්‍රේමකුමාර එපිටවෙලගේ "දියසේන" මුද්‍රා නාට්‍යය හැඳින්වීම සඳහා වීම විශේෂත්වයකි.

1960 දශකයේ ආචාර්ය පණිභාරතයන් විසින් පත්තිනි කතාව ඇසුරින් නිර්මාණය කරන ලද "සත් පත්තිනි" හා නව ග්‍රහයන් පිළිබඳ කියැවෙන "ග්‍රහ අපලය" දේශීය නර්තන ඇසුරින් නිර්මාණය කරන ලද කලා කෘති ය. සංගීතය සඳහා දේශීය ගායන හා බෙර වර්ග යොදා ගන්නා ලද අතර, රංග වස්ත්‍රාභරණ ද දේශීයත්වය පිළිබිඹු වන පරිදි යොදා ගෙන තිබිණ.

චිත්‍රසේන මහතා විසින් විවිධ තේමාවන් ඔස්සේ මුද්‍රා නාට්‍ය වැඩි ම සංඛ්‍යාවක් නිර්මාණය කරන ලද අතර ඉන් කරදිය මුද්‍රා නාට්‍යය කාගේත් ගෞරව සම්මානයට පාත්‍ර විය. චිත්‍රසේන මහතාට උපහාර ලෙස ඔහුගේ ජන්ම දිනය වන ජනවාරි 26 මුද්‍රා නාට්‍ය දිනය ලෙසින් නම් කර ඇත. ප්‍රශස්ත ළමා මුද්‍රා නාට්‍ය කලාවක් බිහි කිරීමෙහි ලා පුරෝගාමී මෙහෙවරක යෙදීමේ ගෞරවය හිමි වනුයේ වජිරා චිත්‍රසේන මහත්මියට ය.

1950 - 70 දක්වා කාලය තුළ දේශීය මුද්‍රා නාට්‍ය වැඩි සංඛ්‍යාවක් නිෂ්පාදනය විය. එය මුද්‍රා නාට්‍ය කලාවේ ස්වර්ණමය යුගය යි. 1961 දී ප්‍රථම රාජ්‍ය මුද්‍රා නාට්‍ය උළෙල පවත්වන ලදී.

මුද්‍රා නාට්‍ය නිෂ්පාදනය කළ ශිල්පීහු කිහිප දෙනෙක් හා ඔවුන්ගේ නිර්මාණ

- කරදිය, නල දමයන්ති, රාමසීතා, රාවණා, විදුර, චණ්ඩාලිකා, කිංකිණි කෝලම.... - චිත්‍රසේන මහතා
- කුමුදුනී, රන් කිකිළි, ශාදි, නිරාශා.... - වජිරා චිත්‍රසේන මහත්මිය
- වනජා, නිල්යකා, ගිනිහොරා (ළමා මුද්‍රා නාට්‍ය)
  හපනා, මූණ නැති යකා .......... (ළමා මුද්‍රා නාට්‍ය)
- සැලලිහිණිය, නිත්ත බත, පරෙවිය, දියවන්නාව, ගමන, කුඹුරු පනත .... - ප්‍රේමකුමාර එපිටවෙල මහතා
- සත් පත්තිනි, ග්‍රහ අපලය, දිවිය මංගලිකා, මහවැලි - එස්. පණිභාරත මහතා
- සාවිත්‍රී, දළ දුන් වග, පටාචාරා, කුණ්ඩලකේශී, සුදෝ සුදු, පැරකුම් විලා - නිමල් වෙල්ගම මහතා
- හිරෝෂිමා, කුඹුරු පනත, තම්බපන්නි, ජන වේගය..... - වසන්ත කුමාර මහතා
- ඉරිදා පොළ, පුෂ්ප ශෘංගාරය, භාව චලන .......... - රේඛා පලිහක්කාර මහතා

(10 ශ්‍රේණිය නර්තනය අතිරේක කියවීම් පොත ඇසුරිණි.)

- උදාව, රන්දද, වේදනා, ...... - ඒ. ඉඹුල්ගොඩ මහතා
- සක්හඬ, පහනෙන් පහන, තරණය, ගමට ඉර පායයි. - ඩබ්.බී. මකුලොළුව මහතා
- ස්වර්ණ තිලකා, තණ්හා ආශා.... - මිරැන්ඩා හේමලතා මහත්මිය

- **කරදිය මුද්‍රා නාට්‍ය හඳුනා ගැනීම**

1961 දී චිත්‍රසේනයන් අතින් නිර්මාණය වූ කලාත්මක මුද්‍රා නාට්‍යයකි 'කරදිය'. භාරතයේ දී නර්තන කලාව හැදෑරීමෙන් ලත් ආභාසයත්, දේශීය නර්තන කලාවන්ගෙන් ලත් දායාදයත්, රාමසීතා, රාවණා හා නල දමයන්ති වැනි මුද්‍රා නාට්‍ය නිර්මාණය කිරීමෙන් ලත් අත්දැකීමත්, මෙවන් නිර්මාණයක් බිහි කිරීමට හේතු පාදක විය. මෙය ශ්‍රී ලාංකේය මුද්‍රා නාට්‍ය කලාව නව මඟකට යොමු කළ, කලා කෘතියකි.

ශාන්තිකර්ම ඔස්සේ නර්තන කලාව හැදෑරූ ශ්‍රී ලාංකේය ප්‍රවීණ නර්තන ශිල්පීන්ට නූතන වේදිකාවට පා තබන්නට කරදිය මුද්‍රා නාට්‍යය ප්‍රබල මාවතක් වූවා සේ ම, එම ශිල්පීන්ගේ දායකත්වය මෙහි සාර්ථකත්වයට ද ප්‍රබල සාධකයක් ද විය.

මෙහි තේමාව වී ඇත්තේ ජන ජීවිතයේ දුක් ගැහැට යි. බලවතා විසින් දුබලයා ග්‍රහණය කර ගැනීම මෙන් ම, ඔවුන් අසරණ කොට තම අපේක්ෂාවන් මුදුන්පත් කර ගැනීම ආදිය හා සමාජ අසාධාරණය පිළිබඳ තොරතුරු මෙම මුද්‍රා නාට්‍යයෙන් මනා ව ඉදිරිපත් කර ඇත.

සිසී මුහුදුකරයේ ජීවත් වන තරුණියකි. විවාහ ගිවිස ගත් චන්ද හා පිරිස මුහුදු ගොස් එන තෙක් ඇය වෙරළේ බලා සිටී. ඔවුහු හිස් අතින් පැමිණෙති. මන්නාඩිරාල කෝපයට පත් වෙයි. සිසී තම වසඟයට ගැනීමට මන්නාඩිරාල උත්සාහ කරයි. ඔහුගේ ආධිපත්‍යයට බිය වන සිසීගේ අසල්වාසීහු මන්නාඩිරාල වෙත යන්නට සිසීට බල කරති.

ගොදුරු අල්ලා ගැනීමට දැලක් වියන මකුළුවකු මැස්සන් පිරිසක් එකතු ව පරාජය කරන ආකාරය සිසී සිහිනයෙන් දකී. සිහිනය ඉටු නො වේ. කුණාටුවක් හමයි. සිසීගේ පෙම්වතා හා පිරිස කුණාටුවට හසු වී මිය යති.

**නර්තනය**

තේමාව විකාශනයේ දී ඒකල, යුගල හා සමූහ නර්තන අංග යොදා ගෙන ඇති අතර,

- දේශීය නර්තන සම්ප්‍රදායයන්
- බටහිර බැලේ ආභාසය
- භාරතීය නර්තන හා මුද්‍රා භාවිත
- සම්ප්‍රදායයකට කොටු නොවූ ප්‍රකාශනාත්මක චලන

යනාදිය ඇසුරු කර ගනිමින් නිර්මාණාත්මක ලෙස නර්තනය යොදා ගෙන ඇත.

(10 ශ්‍රේණිය නර්තනය අතිරේක කියවීම් පොත ඇසුරිණි.)

### ගීතය

පසුබිම් සංගීතය දේශීයත්වයත්, ගැමි ජනතාවගේ ස්වභාවයත්, එහි පරිසරය හා ඔවුන්ගේ ජීවන රිද්මයත් ඉස්මතු කරයි.

හෝයියා හෝයියා හෝයියා හෝයියා
ජීවිතයත් මුහුද වගේ
ඉමක් නැතේ කොනක් නැතේ
යනවා ආපහු එනවා
එනවා ආපහු යනවා
කරදර දුක් ගැහැට මැදින් ………………

- ### රංග වස්ත්‍රාභරණ

රංග වස්ත්‍රාභරණ නිර්මාණයේ දී චරිත සඳහා උචිත වර්ණ භාවිතය කැපී පෙනෙයි. සිසී, චන්ද හා ධීවර වැසියන චරිත සඳහා ගැමි ඇඳුම් පැළඳුම් නිර්මාණාත්මක ව යොදා ගෙන ඇත.

නිර්මාණ ශිල්පියාගේ දක්ෂතාව විදහා දක්වෙන අවස්ථාවක් ලෙස මකුළුවාගේ හා මැස්සන්ගේ රංග වස්ත්‍රාභරණ හැඳින්විය හැකි ය. චරිත ලක්ෂණ මනා ව විදහා දක්වෙන අයුරින් ඒවා නිර්මාණය කර ඇත.



සිසී



මකුළුවා



පසුබිම් දසුනක්

රංග වස්ත්‍රාභරණ, පසුබිම් අලංකරණ, ධීවර ගැමි ජනතාවගේ ස්වභාවයත් එම පරිසරයත් මවා පායි. ගල්පර, පැල්පත, මුහුදු රළ, වැටකෙයියා පඳුරු, මකුළුවාගේ දල වැනි සංකේතයන් ආලෝකකරණය මගින් අවස්ථාවට උචිත පරිදි මතු කර දක්වයි.

(10 ශ්‍රේණිය නර්තනය අතිරේක කියවීම් පොත ඇසුරිණි.)

| | | |
|---|---|---|
| සංකල්පය හා රංග රචනය | - | චිත්‍රසේන ඩයස් |
| | | වජිරා චිත්‍රසේන |
| සංගීත නිර්මාණය හා ගායනය | - | ඩබ්.ඩී. අමරදේව |
| සහාය | - | ලයනල් අල්ගම |
| රංග වස්ත්‍රාභරණ හා පසුබිම් අලංකරණ | - | සෝමබන්ධු විද්‍යාපති |
| ආලෝකකරණය | - | මහින්ද ඩයස් |
| රංගන දායකත්වය | - | |
| සිසී | - | වජිරා චිත්‍රසේන |
| මන්නාඩිරාල හා මකුළුවා | - | චිත්‍රසේන ඩයස් |
| චන්ද | - | සේන වලවේ |
| මහලු මිනිසා හා මන්නාඩිරාලගේ සගයා | - | කේ.එන්.එස්. අටුගොඩ |
| | | ඇතුළු නළුනිළියෝ |

## කුඹි කථාව

| | | |
|---|---|---|
| **ප්‍රථම නිෂ්පාදනය** | - | **2007** |
| **පිටපත** | - | **ටානියා බැරකෝම්බා** |
| **රංග රචනය** | - | **අංජලිකා චිත්‍රසේන** |
| **කලා කටයුතු හා රංග වස්ත්‍ර නිර්මාණය** | - | **මහේෂ් උමගලිය** |
| **සංගීතය** | - | **රොබට් ජුලින්ෆී ඇතුළු පිරිස** |

කථාව : කුඹීහු තම රාජධානියේ එදිනෙදා කටයුතුවල නිරත වෙති. විවිධ කුහුඹු පවුල් එහි වාසය කරමින් කුහුඹු රැජිනගේ අණට අනුව කටයුතු කරති. රෙදි විවීම, රෙදි සේදීම, කෑම පිසීම, පිරිසිදු කිරීම මොවුන්ගේ කාර්යයෝ ය.

දිනක් කුහුඹු පවුලක් තම රාජ්‍යයෙන් ඈතට කෑම සෙවීම සඳහා පිටත් වේ. මේ අතරතුර මඳුරුවෙක් පැමිණේ. කුහුඹින්ගේ නිවාස කඩා බිඳ දමයි. කුහුඹින් නැවත එන විට දකින්නට ලැබුණේ ඒවා විනාශ වී ඇති බව යි. ඔවුහු නැවත රාජ්‍යය ගොඩ නැගූහ. ඉන්පසු ව තම අසල්වැසි යහළුවන්ට තේ පැන් සංග්‍රහයක් සූදානම් කළහ. එම සාදයට තණකොළ පෙත්තෝ, කුරුමිණියෝ හා සමනළයෝ පියාඹාගෙන පැමිණෙති.

සාදය ජයට පවතින විට සුළඟ සමග වැස්සක් විත් මුළු ප්‍රදේශයම ජලයෙන් යටවෙයි. පියාපත් ඇති අය ඉගිළී ගෙන යති. කුහුඹුවෝ හා අනෙකුත් අය ටින් එක උඩට නැගී බලා හිඳිති. පණ බේරා ගැනීමට දඟලන මඳුරුවා ද කුඹින් විසින් බේරා ගනු ලැබේ.

(10 ශ්‍රේණිය නර්තනය අතිරේක කියවීම් පොත ඇසුරිණි.)